# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ජුනි මස 14 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.06.17 දින නිකුත් කරන ලදී)


# උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන)

**උසස් අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා වන ආයතනවල සහ විද්‍යාත්මක හා කාර්මික ආයතනවල සම්බන්ධීකරණය සහ ප්‍රමිති නිශ්චය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා වූ නෛතික සැලැස්මක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 73.00 තැපැල් ගාස්තුව : රු. 35.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## උසස් අධ්‍යාපන
## (තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන)

එල්.ඩී.— ඕ. 29/2011

**උසස් අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා වන ආයතනවල සහ විද්‍යාත්මක හා කාර්මික ආයතනවල සම්බන්ධීකරණය සහ ප්‍රමිති නිශ්චය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා වූ නෛතික සැලැස්මක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.**

1. (1) මේ පනත 2019 අංක දරන උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනත එහි විධිවිධාන සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක හෝ දිනවල ක්‍රියාත්මක විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන, මෙම පනත සම්බන්ධයෙන් කතානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සහතිකය පිටසන් කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

### I වන කොටස

### උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව

**උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම.**

2. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක්, උසස් අධ්‍යාපනය සඳහා වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන ජාතික අධිකාරිය ලෙස පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මඟින් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් කොමිෂන් සභාව විසින් සහ කොමිෂන් සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

**3.** කොමිෂන් සභාවේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය :- කොමිෂන් සභාවේ අරමුණු.

(අ) උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපන සුදුසුකම් හි තත්වය පිළිබඳ වන උසස් ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා යහපාලන ප්‍රතිපත්ති මත පදනම් වූ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන ක්‍රමෝපායක් ඇති කිරීම;

(ආ) ජාතික මට්ටමින් තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා ප්‍රධාන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම;

(ඇ) වැඩසටහන් එකිනෙක අතර තිරස් සචලතාව සඳහා පහසුකම් සැලසීම පිණිස ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) අනුකූලව වෙනස් සුදුසුකම් සැලසුම් කිරීම.

**4.** කොමිෂන් සභාව - කොමිෂන් සභාවේ සංයුතිය.

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම් -

(i) උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ එම සභාපති විසින් නම් කරනු ලබන එම කොමිෂන් සභාවේ උප සභාපතිවරයකු;

(iv) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ එම සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම කොමිෂන් සභාවේ උප සභාපතිවරයකු; සහ

(ආ) අමාත්‍යවරයා විසින් නම් කරන ලද තැනැත්තන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයක් අතරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් නව දෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා නම් කරන ලද තැනැත්තන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලය තත්ත්ව සහතික කිරීම, අධ්‍යාපනික, වෘත්තීය, වාණිජමය, කළමනාකරණ, කාර්මික, විද්‍යාත්මක, නීති හෝ පරිපාලනමය ක්ෂේත්‍රයක් හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ සාධනය කරන ලද හැකියාව පෙන්වා ඇති සහ අධ්‍යාපන සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද සහිත තැනැත්තන් අතුරින් විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු නම් කිරීමට පෙරාතුව, කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වන කිසිදු මූල්‍යමය හෝ වෙනත් ලැදියාවන් අතර ගැටුමක් එම තැනැන්තාට නොමැති බවට තමා විසින් සෑහීමට පත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් එම නම් කිරීමේ දී ස්ත්‍රී පුරුෂභාවය ද ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ස්වභාවය නිරූපණය කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා ප්‍රයත්න දැරිය යුතු ය.

(5) ජනාධිපතිවරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයන් අතුරින් උසස් අධ්‍යාපනයෙහි තත්ත්ව සහතික කිරීමට අදාළ කරුණු පිළිබඳ කටයුතු කිරීම සම්බන්ධයෙන් යම් සාමාජිකයකු සතු පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් එම සාමාජිකයා සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(6) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හැර සභාපතිවරයා ද ඇතුලුව අවම වශයෙන් සාමාජිකයන් පස් දෙනෙකු පූර්ණ කාලීන සාමාජිකයන් ලෙස කටයුතු කළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්.

**5.** (1) පහත දැක්වෙන හේතු මත, යම් තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට, නම් කිරීමට හෝ දිගටම කටයුතු කරගෙන යාම සඳහා නුසුදුසු විය යුතු යː-

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වන්නේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු බවට පත් වන්නේ නම්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ වන යම් හිමිකමක් හෝ ප්‍රතිලාභයක් ඔහු විසින් ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින්, ඍජුවම හෝ වක්‍රාකාරයෙන් දරනු ලබන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් හෝ දරනු ලැබීමට පත්වන්නේ නම් හෝ භුක්ති විඳිනු ලැබීමට පත්වන්නේ නම්;

(ඇ) කොමිෂන් සභාවේ කටයුතුවල දී ඔහුට යම් මූල්‍යමය හෝ වෙනත් ලැදියාවක් අතර ගැටුමක් ඇත්නම්;

(ඈ) ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන ධුර කාලය තුළ -

(i) යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් සේවා නියුක්තියක හෝ පැවරුමක; හෝ

(ii) යම් උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම සහ පරිපාලනය පිළිබඳ වගකීම දරන යම් ආයතනයක සේවා නියුක්තියක;

යෙදී සිටින්නේ නම්;

(ඉ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(ඊ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(උ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් යම් අපරාධ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඌ) ඔහු කොමිෂන් සභාවේ පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් හයකට නොපැමිණ සිටින්නේ නම්:

එසේ වුව ද, එවැනි නොපැමිණීමක් සඳහා වන අවසරය ඕනෑම අවස්ථාවක දී මාස තුනක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය;

(එ) ඔහු වයස අවුරුදු හැත්තෑ දෙක ඉක්මවන්නේ නම්.

සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම.

**6.** 4 වන වගන්තිය යටතේ පත් කළ යම් සාමාජිකයකු -

(අ) 5 වන වගන්තියෙහි දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වුවහොත්;

(ආ) යම් ශාරීරික ආබාධයක් හෝ සිහිවිකල් බව හේතුවෙන් ස්ථිරව ඔහුගේ රාජකාරි ඉටු කිරීමට නොහැකි බවට පත් වුවහොත්; හෝ

(ඇ) කොමිෂන් සභාව අපකීර්තියට පත් කිරීමට ඉඩ ඇති යම් ක්‍රියාවක් සිදු කරන්නේ නම්,

ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**7.** (1) සභාපතිවරයා ඇතුළුව කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, තමා ඒ ධුරයට පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය:

එසේ වුව ද, කිසිම සාමාජිකයකු අනුගාමී ධුර කාල දෙකකට වඩා කොමිෂන් සභාවට පත් කරනු නොලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත දැන්වීමක් සහිතව ජනාධිපතිවරයා අමතා තම අත්සන යටතේ වූ ලිපියක් මගින් අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට සභාපති ධුරයෙන් හෝ සාමාජික ධුරයෙන් ඕනෑම අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි ය. ජනාධිපතිවරයා විසින් එම ඉල්ලා අස්වීම ලිඛිතව පිළිගැනීම මත එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) 4 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු ඉල්ලා අස්වීම, ඉවත් කරනු ලැබීම හෝ මිය යෑම නිසා සිය ධුරය අත්හරී නම්, ජනාධිපතිවරයා විසින්, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් නම් කරන ලද මූල මණ්ඩලයේ ඉතිරි සාමාජිකයන්ගෙන් එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර එම තැනැත්තා තමා අනුප්‍රාප්තික සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවී ඉතිරි වූ කාලසීමාව සඳහා එම ධුරය දැරිය යුතු ය.

(4) සභාපතිවරයා රෝගාතුරවීම, අශක්නුතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සිය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වුවහොත්, ජනාධිපතිවරයා විසින් පූර්ණ කාලීන සාමාජිකයකු සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

8. (1) කොමිෂන් සභාව පූර්ණ කාලීන පදනමින් කටයුතු කළ යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීම් අවම වශයෙන් මසකට සිව් වරක් පවත්වනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමෙහි මූලාසනය දැරීම සඳහා ඔවුන් අතරින් යම් සාමාජිකයකු තෝරා පත් කරගත යුතු ය.

(4) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය, සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය. අවම වශයෙන් එක් සාමාජිකයකුවත් පූර්ණ කාලීන නොවන සාමාජිකයකු විය යුතු ය.

(5) ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන වන විටක, සභාපතිවරයාට හෝ සභාපතිවරයා පැමිණ නොමැති විටක දී නම් යම් රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට හෝ ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(6) සාමාජිකයන්ගේ ඡන්ද, කොමිෂන් සභාවේ වාර්තා පොතෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයන් පස් දෙනෙකුට වඩා අඩු සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ සිටින්නේ නම්, මේ වගන්තියේ (9) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොවන පරිදි, කොමිෂන් සභාවේ පූර්ව අවසරය ඇතිව විද්‍යුත් හෝ වෙනත් යම් සන්නිවේදන මාධ්‍යයක් මගින්, ශ්‍රී ලංකාවේ නොසිටින යම් සාමාජිකයකුට රැස්වීමක් සඳහා සහභාගී විය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ රැස්වීමකට සහභාගී වන සාමාජිකයකු එම රැස්වීමට පැමිණ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) කොමිෂන් සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

(10) කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ දී සිදු වූ යම් දෝෂයක් නිසා හෝ අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය.

**9.** කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුත්තේ යඃ-

(අ) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව,සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ යාවත්කාලීන කිරීම;

(ආ) තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනයට අදාළ කරුණු පිළිබඳ යම් වෘත්තීය හෝ යම් ව්‍යවස්ථාපිත හෝ යම් නියාමන මණ්ඩලයක් සමඟ හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පිහිටි උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන මණ්ඩල සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම තහවුරු කිරීම, පවත්වාගෙන යාම;

(ඇ) නියම කරන ලද මාර්ගෝපදේශ අත්පොත්, මෙවලම්, උපකරණ හෝ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව උසස් අධ්‍යාපන ආයතන තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා සුදුසු පරිදි ප්‍රතිපත්ති, ප්‍රමිතීන් සහ උපමාන නිශ්චය කිරීම සහ ප්‍රමිතීන්, උපමාන, කාර්ය පටිපාටි සහ ක්‍රියා පද්ධති යාවත්කාලීන කිරීම;

(ඈ) ආයතනික සහ වැඩසටහන් විගණන සහ බාහිර තත්ත්ව සහතික කිරීමේ සමාලෝචන සිදු කිරීම සඳහා පුහුණු සහ පළපුරුදු තත්ත්ව විගණකවරු පත් කිරීම;

(ඉ) උසස් අධ්‍යාපන ආයතනවලට සහ වැඩසටහන්වලට තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කිරීම සහ කලින් කලට එවැනි ප්‍රතීතන සමාලෝචනය කිරීම;

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද අපේක්ෂිත තත්ත්වය සහ ප්‍රමිති පවත්වාගෙන නොයන්නා වූ උසස් අධ්‍යාපන ආයතන සහ වැඩසටහන්වලට ප්‍රදානය කරන ලද තාවකාලික ප්‍රතීතනය හෝ පූර්ණ ප්‍රතීතනය අවලංගු කිරීම;

(උ) උසස් අධ්‍යාපන ආයතනයක් හෝ වැඩසටහනක් මගින් ප්‍රතීතන අවශ්‍යතාවයන් හා අනුකූල නොවීම සම්බන්ධයෙන් වන යම් පැමිණිලි විභාග කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම;

(ඌ) අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ වෘත්තියමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විමසා විදේශ උපාධි, ඩිප්ලෝමා හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා හඳුනාගැනීම හෝ ප්‍රතීතනය කිරීමේ කාර්යය සඳහා එවැනි උපාධි, ඩිප්ලෝමා හෝ ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇගයීම;

(එ) අධ්‍යයන වැඩසටහන් වලට ශිෂ්‍යයන් ලියාපදිංචිය සඳහා ඇති අවම ඇතුළත් වීමේ නිර්ණායක, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) හා අනුකූල වන්නේ ද යන්න, අවශ්‍ය අවස්ථාවල දී අදාළ වෘත්තීයමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විමසා කලින් කල ඇගයීම් කිරීම;

(ඒ) උසස් අධ්‍යාපන ආයතන වලින් ප්‍රදානය කරන ලද උපාධි සහ සුදුසුකම්, සුදුසුකම් හඳුනාගැනීමේ ලක්ෂණවල සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවෙහි (SLQF) සඳහන් කර ඇති අධ්‍යයන ප්‍රතිඵල හා අනුකූල වන්නේ ද යන්න තක්සේරු කිරීම;

(ඔ) උසස් අධ්‍යාපන වැඩසටහන් වලට සහ උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමන ලද වෘත්තීය සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් සඳහා අනුගමනය කරනු ලැබීමට, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවට (SLQF)අනුව අදාළ සුදුසුකම් මට්ටම සඳහා නිර්දේශ සැකසීම;

(ඕ) වැඩසටහන් එකිනෙක අතර තිරස් සංචලතාව සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) සහ ජාතික වෘත්තීය යෝග්‍යතා රාමුව (NVQF) ඇතුලුව වෘත්තීයමය සුදුසුකම් අපේක්ෂාවෙන් වැඩසටහන් එකිනෙක අතර තිරස් සචලතාව සඳහා ශිෂ්‍යයන්ට පහසුකම් සැලසීම පිණිස උසස් අධ්‍යාපන සුදුසුකම් සැලසුම් කිරීම;

(ක) වයස පිළිබඳ යම් සීමා කිරීම්වලින් යම් නිදහස් කිරීම් ඇතුළත්ව යම් තැනැත්තන්ගේ ශක්‍යතා, පළපුරුද්ද සහ හැකියාවන් මත පදනම්ව උසස් අධ්‍යාපනයෙහි නිරතවීමට ඔවුන්ට හැකියාව ලැබෙන පරිදි අවස්ථාවන් සැලසීම සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට නිර්දේශ කිරීම;

(ග) උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නිර්දේශ සැකසීම;

(ච) උසස් අධ්‍යාපනයට අදාළ තොරතුරු එකතු කිරීම, බෙදාහැරීම සහ ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනවල සහ ප්‍රතීතිත වැඩසටහන්වල ලේඛණයක් පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම සහ එකී ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනවල සහ ප්‍රතීතිත වැඩසටහන්වල නම් මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල පළ කිරීම;

(ජ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පත් කිරීම හෝ විශේෂඥයන් සහ කමිටු පත් කිරීම;

(ට) කොමිෂන් සභාව විසින් සපයන ලද යම් සේවාවක් සඳහා ගාස්තු හෝ අය කිරීම් අයකර ගැනීම;

(ඩ) උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ සුදුසු විය හැකි යම් එකඟතා සහ ගිවිසුම්වලට එළඹීම;

(ණ) ඔවුන්ගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි චක්‍රලේඛ කලින් කලට සියලු උසස් අධ්‍යාපන ආයතන සහ ඒවායේ වෘත්තීය සහ අධ්‍යයන කාර්ය මණ්ඩල වෙත නිකුත් කිරීම;

(ත) උසස් අධ්‍යාපනය සපයන උසස් අධ්‍යාපන ආයතන සහ අනෙකුත් සංවිධාන හෝ උසස් අධ්‍යාපන සැපයීම හා සම්බන්ධිත හෝ ඊට අදාළ යම් සේවාවක් ඍජුව හෝ වක්‍රව හෝ අර්පනය කරන හෝ සපයන පුද්ගල මණ්ඩල ප්‍රතීතනය කිරීම සඳහා නියෝග මගින් නියම කළ ක්‍රමෝපායක් නිර්මාණය කිරීම සහ පරිපාලනය කිරීම;

(ද) අන්තර්ගතය, සැපයීම සහ උසස් අධ්‍යාපන සේවාවන් සඳහා තාක්ෂණික ප්‍රමිතිවලට අදාළ කාර්ය සාධන සංග්‍රහයන් සංවර්ධනය කිරීම සහ පළ කිරීම සහ එකී සංග්‍රහයන්ට අනුකූලව අධීක්ෂණය කිරීම;

(න) 52 වන වගන්තිය යටතේ නියෝගවලින් නියම කර ඇති ආකාරයට දේශීය හෝ විදේශීය වෘත්තීයමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයක් පිළිගැනීම;

(ප) වෘත්තිමය වැඩසටහනකට හෝ සුදුසුකමකට ප්‍රතීතනය ප්‍රදානය කිරීම සම්බන්ධ අවම ප්‍රමිතීන් තීරණය කිරීම සඳහා අදාළ වෘත්තියමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල වලට නියම කිරීම;

(ඛ) කොමිෂන් සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සහ කිරීම හා අදාළවන හෝ සම්බන්ධ පර්යේෂණ, සංවර්ධන අධ්‍යයන සහ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිවල නියැලීම;

(ම) *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නිවේදනයක් මඟින් ප්‍රතීතිත මට්ටම් සහ සහතික කිරීම නිශ්චිතව දැන්වීම සහ කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන ආයතනවලට සහ ඒහි වැඩසටහන්වලට අනුමත කරන ලද සහ ප්‍රදානය කරන ලද සලකුණු සහ ලාංඡන පරීක්ෂා කිරීම, එකී සළකුණු හෝ ලාංඡන භාවිතය පාලනය කිරීම;

(ය) යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීමෙන් හෝ අන්‍යාකාරයෙන් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ කොමිෂන් සභාවේ එකී යම් චංචල හෝ නිශ්චල දේපළක් මේ පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(අඅ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඕනෑම බැංකුවක් සමඟ බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සහ කොමිෂන් සභාව වෙනුවෙන් එකී ගිණුම හෝ ගිණුම් ක්‍රියාත්මක කිරීමට යම් තැනැත්තකු වෙත බලය පැවරීම;

(අආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව සතු කර්තව්‍යයන්ට සමාන කර්තව්‍යයන් හෝ කාර්යයන් සහිත යම් අන්තර්ජාතික මණ්ඩලයක සාමාජිකයෙකු වීම හෝ නිල වශයෙන් එම ආයතනය සමඟ සම්බන්ධ වීම;

(අඇ) කොමිෂන් සභාව විසින් ම හෝ වෙනත් යම් අධිකාරියක් සමඟ සම්බන්ධ වී, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් ප්‍රදේශයන් තුළ දී, කොමිෂන් සභාව සතුවන කුසලතාව හෝ ප්‍රවීනතාව තුළ උපදේශන සේවා හෝ යම් තාක්ෂණික, කළමනාකරණ හෝ වෙනත් සේවාවන් සැපයීම;

(අඈ) මූලාශ්‍රය කුමක් වුව ද, ප්‍රදානයන් හෝ දායක මුදල් ලබා ගැනීම සහ සියලු නීත්‍යානුකූල ආකාරයන්ගෙන් අරමුදල් ඉහළ නැංවීම සහ එකී අරමුදල් කොමිෂන් සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යෙදවීම;

(අඉ) කොමිෂන් සභාවේ නිලධරයන්ට සහ අනෙකුත් සේවා නියුක්තිකයන්ට හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක උසස් අධ්‍යාපනය සැපයීමෙහි නිරත යම් තැනැත්තෙකුට, කොමිෂන් සභාව යෝග්‍ය යයි සිතන ආකාරයට කොමිෂන් සභාව විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ සහයෝගයෙන් තත්ත්ව සහතික කිරීම, ප්‍රතීතනය සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) පිළිබඳව පුහුණුවීම් සැපයීම සහ එවැනි පුහුණුවීම් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(අඊ) මේ පනත යටතේ රීති සකස් කිරීම අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(අඋ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට යෝග්‍ය විය හැකි, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන වෙනත් එවැනි සියලු කාර්යයන් කිරීම.

## II වන කොටස

### උසස් අධ්‍යාපන ආයතන ප්‍රතීතනය කිරීම

වෙනත් ලිඛිත නීති අභිබවා මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු බව.

**10.** (1) මේ පනතේ විධිවිධාන ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් හීන කිරීමට නොව ඊට අතිරේකව වූවක් විය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන, බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන හා එවැනි වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් හෝ ගැටුමක් ඇති වූ අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

සෑම උසස් අධ්‍යාපන ආයතනයක් ම ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කළ යුතු බව.

**11.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සෑම උසස් අධ්‍යාපන ආයතනයක් ම ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් කටයුතු කර ගෙන යාම සඳහා එකී උසස් අධ්‍යාපන ආයතනයට පහසුකම් සැපයීම පිණිස නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් එවැනි ආකෘතියකින් සහ ආකාරයකට ඊට අදාළ ගාස්තුව ද සමඟ ප්‍රතීතනය සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කළ යුතු යː

එසේ වුව ද -

(අ) මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුව ම වන දිනයෙහි පැවැති, පාර්ලිමේන්තු පනතක් මගින් සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවන ලද බවට සැලකිය යුතු සෑම විශ්වවිද්‍යාලයකට ම; සහ

(ආ) මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුවම වන දිනයෙහි පැවති 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය යටතේ උපාධි ප්‍රදානය කිරීමේ අයිතිය පිරිනැමූ සෑම උසස් අධ්‍යාපන ආයතනයකට ම;

මේ පනත බලාත්මක වන දින සිට වසර පහක කාලයක් සඳහා මේ පනත යටතේ පූර්ණ ප්‍රතීතනය ලබා දී ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(2) එම ප්‍රතීතනය සඳහා කොමිෂන් සභාවට ඉල්ලුම් කිරීම, අවස්ථාවෝචිත පරිදි, උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා හෝ මූලික විධායක නිලධරයා හෝ මූලික පරිපාලන නිලධරයාගේ වගකීම විය යුතු ය.

නව උසස් අධ්‍යාපන ආයතනයක් සඳහා මූලික නිෂ්කාශනය නිකුත් කිරීම.

**12.** (1) නව උසස් අධ්‍යාපන ආයතනයක් විසින් එය පිහිටුවීමට පෙර සහ කිසිදු ක්‍රියාවක් ආරම්භ කිරීමට පෙර නියෝගවලින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකට සහ ආකාරයකට යුතුව, එකී ලේඛන සහ ගාස්තු සමඟ භෞතික යටිතල පහසුකම් ආරම්භ කිරීමේ මූලික නිෂ්කාශනයක් සඳහා, කොමිෂන් සභාවට ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසු සහ මූලික නිෂ්කාශන සහතිකය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් නියෝග මගින් නියම කර ඇති අවශ්‍යතාවයන්, උසස් අධ්‍යාපන ආයතනය

විසින් සපුරා ඇති බවට සෑහීමකට පත් වීමෙන් පසුව, එසේම එවැනි ආයතනයක් පිහිටුවීම මහජන සුහසිද්ධිය සහ මහජනතාවගේ ප්‍රයෝජනය පිණිස වන බවට කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, එවැනි ඉල්ලුම්පත්‍රයක දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත යම් නියම සහ කොන්දේසි වලට යටත්ව වසර පහක කාල සීමාවක් සඳහා කොමිෂන් සභාව විසින් මූලික නිෂ්කාශන සහතිකයක් ප්‍රදානය කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එකී ආයතනය වෘත්තීයමය වැඩසටහන් ප්‍රදානය කිරීම අදහස් කරනු ලබන විට දී, මූලික නිෂ්කාශන සහතිකය ප්‍රදානය කිරීමට පෙර කොමිෂන් සභාව විසින් අදාළ වෘත්තීයමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විමසනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් එකී වෘත්තීයමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විමසනු ලැබූ අවස්ථාවක දී, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මූලික නිෂ්කාශනය ප්‍රදානය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් සහයෝගය දැක්වීම එකී මණ්ඩලයේ වගකීම විය යුතු ය.

(4) (අ) නියෝග මගින් මූලික නිෂ්කාශනය ප්‍රදානය කිරීම සඳහා නියම කර ඇති නිර්ණායක සම්පූර්ණ කිරීමට උසස් අධ්‍යාපන ආයතනය අපොහොසත් වන විට දී, මූලික නිෂ්කාශන සහතිකය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) උසස් අධ්‍යාපන ආයතනය පිහිටුවනු ලැබීමේ දින සිට වසර පහක කාලසීමාවක් ඇතුළත ප්‍රගතියක් නොමැති විට දී, මූලික නිෂ්කාශන සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කිරීම;

(ඇ) වසර පහක කාලසීමාවක් ඇතුළත එහි කටයුතු ආරම්භ කිරීමට උසස් අධ්‍යාපන ආයතනය අපොහොසත් වන විට දී මූලික නිෂ්කාශන සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කිරීම,

කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (4) වන උපවගන්තියෙහි සඳහන් කරන ලද මූලික නිෂ්කාශන සහතිකය ප්‍රතික්ෂේප කරන ලද හෝ ප්‍රත්‍යාදිෂ්ට කරන ලද අවස්ථාවක, වසර තුනක කාලසීමාවක් ඇතුළත එම අසාර්ථකවීම නිවැරදි කිරීම සඳහා පියවර ගැනීමට උසස් අධ්‍යාපන ආයතනයට නියම කරනු ලැබිය හැකි ය.

නව උසස් අධ්‍යාපන ආයතනයක් හෝ පවතින උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කිරීම.

13. (1) නව උසස් අධ්‍යාපන ආයතනයක් විසින් සිසුන් බඳවා ගැනීමට පෙරාතුව නිෂ්කාශන සහතිකය ලද දිනයේ සිට වසර පහක කාලසීමාවක් ඇතුළත 11 වන වගන්තිය යටතේ එම ආයතනය ප්‍රතීතනය සඳහා කොමිෂන් සභාවට ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) 11 වන වගන්තියේ ව්‍යතිරේඛයේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයන් මේ පනත බලාත්මක වන දිනයේ සිට වසර පහක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව එම ආයතනයේ ප්‍රතීතනය සඳහා 11 වන වගන්තිය යටතේ ඉල්ලුම් කළ යුතු ය.

(3) 11 වන වගන්තියේ ව්‍යතිරේඛයේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයක් හැර මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී යම් උසස් අධ්‍යාපන ආයතනයක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක -

(අ) එකී ආයතනය වසර පහකට වැඩි කාලයක් ක්‍රියාත්මකව පැවති ආයතනයක් නම්, වසර දෙකක කාලසීමාවක් ඇතුළත; හෝ

(ආ) එම ආයතනය වසර පහකට වඩා අඩු කාලයක් ක්‍රියාත්මකව පැවති ආයතනයක් නම්, වසර හතක පැවැත්ම සම්පූර්ණ කිරීමට පෙරාතුව;

11 වන වගන්තිය යටතේ ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(4) (අ) කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද යම් කොන්දේසිවලට යටත්ව එම ආයතනයට තාවකාලික ප්‍රතීතන හෝ පූර්ණ ප්‍රතීතන සහතිකයක් ප්‍රදානය කිරීම; හෝ

(ආ) ප්‍රතීතනය ප්‍රදානය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයේ වාර්තාවෙහි හඳුනාගන්නා ලද ගැටලු නිවැරදි කිරීම සඳහා පියවර ගැනීමට අදාළ උසස් අධ්‍යාපන ආයතනයට නියම කිරීම; හෝ

(ඇ) හේතු දක්වා තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම,

කොමිෂන් සභාව විසින්, කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (4) වන උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) උසස් අධ්‍යාපන ආයතනයේ ආයතනික විගණනය සඳහා සම්පූර්ණ හෝ තාවකාලික ප්‍රතීතනය ප්‍රදානය කිරීමට අදාළව නියම කරන ලද උපමාන සමඟ ආයතනයේ අනුකූලත්වය, තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයේ වාර්තාව සහිතව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ආ) විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක් සමග අනුබද්ධ වී ඇති විට, වෙනත් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ උසස් අධ්‍යාපන ආයතනයක් වන විට දී, එම උසස් අධ්‍යාපන ආයතනයේ ආයතනික විගණන සම්බන්ධයෙන් අදාළ විදේශීය අධිකාරියේ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

නව හෝ පවතින උසස් අධ්‍යාපන ආයතනයක වැඩසටහන් ප්‍රතීතනය.

**14.** (1) නව උසස් අධ්‍යාපන ආයතනයක් විසින් මූලික නිෂ්කාශන සහතිකය ලැබීමෙන් වසර පහක කාලසීමාවක් ඇතුළත 11 වන වගන්තිය යටතේ එහි එක් එක් වැඩසටහන් ප්‍රතීතනය කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) 11 වන වගන්තියේ ව්‍යතිරේඛයෙහි සඳහන් උසස් අධ්‍යාපන ආයතනයක් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් ඉකුත් වූ පසුව එහි වැඩසටහන් ප්‍රතීතනය සඳහා 11 වන වගන්තිය යටතේ ඉල්ලුම් කළ යුතු ය.

(3) 11 වන වගන්තියේ ව්‍යතිරේඛයෙහි සඳහන් උසස් අධ්‍යාපන ආයතනයක් හැර, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී යම් උසස් අධ්‍යාපන ආයතනයක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක දී -

(අ) එම ආයතනය වසර පහකට වැඩි කාලයක් ක්‍රියාත්මකව පැවති ආයතනයක් නම් වසර දෙකක කාලසීමාවක් ඇතුළත; හෝ

(ආ) එම ආයතනය වසර පහකට අඩු කාලයක් ක්‍රියාත්මකව පැවති ආයතනයක් නම්, වසර හතක පැවැත්ම සම්පූර්ණ කිරීමට පෙර,

එහි වැඩසටහන් ප්‍රතීතනය කිරීම සඳහා 11 වන වගන්තිය යටතේ ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද කොන්දේසිවලට යටත්ව එම වැඩසටහන් සඳහා තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතන සහතිකයක් ප්‍රදානය කිරීම;

(ආ) තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයේ වාර්තාවේ හඳුනාගන්නා ලද ගැටලු කොමිෂන් සභාව මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ලබා දෙන ලද කාලසීමාව ඇතුළත නිවැරදි කරනු ලැබුවේ නම් එම වැඩසටහනට තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතන සහතිකයක් ප්‍රදානය කිරීම;

(ඇ) යම් වෘත්තීයමය වැඩසටහනක අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විසින් 15 (4) වන වගන්තිය යටතේ සාදන ලද නිර්දේශවල හඳුනාගන්නා ලද ඌනතා අවස්ථාවෝචිත පරිදි, එම නිර්දේශවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ හෝ දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් තුළ නිවැරදි කරනු ලැබුවේ නම්, එම වැඩසටහනට තාවකාලිකව හෝ පූර්ණ ප්‍රතීතන සහතිකයක් ප්‍රදානය කිරීම;

(ඈ) හේතු දක්වා තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම,

කළ හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (4) වන උපවගන්තියේ කාර්යය සඳහා-

(අ) වෘත්තීය වැඩසටහන් සම්බන්ධයෙන් වන විට, එම වැඩසටහනට අදාළ තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයේ වාර්තාව සහ 15 වන වගන්තිය යටතේ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල නිර්දේශ සැලකිල්ලට ගත යුතු ය.

(ආ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ සහ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයන් සමග අනුබද්ධ වී ඇති යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද විදේශීය වැඩසටහන් සම්බන්ධයෙන් වන විට අදාළ විදේශීය අධිකාරියේ නිර්දේශ සැලකිල්ලට ගත යුතු ය.

දේශීය සහ විදේශීය වෘත්තීය වැඩසටහන් සහ සුදුසුකම්.

**15.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, උසස් අධ්‍යාපන ආයතනයක් එම උසස් අධ්‍යාපන ආයතනය සැපයීමට අපේක්ෂිත යම් දේශීය හෝ විදේශීය වෘත්තීය වැඩසටහන්වල ප්‍රතීතනය ප්‍රදානය කිරීම සඳහා 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම් පත්‍රය ලැබීමෙන් පසු කොමිෂන් සභාව විසින්, උසස් අධ්‍යාපන ආයතනයකින් එම ඉල්ලුම් පත්‍රය ලද දිනයේ සිට දින දාහතරක කාලසීමාවක් ඇතුළත, නිර්දේශ කිරීමේ කාර්යය සඳහා වන ඉල්ලීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත නිර්දේශ අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයට කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් ලැබුණු අවස්ථාවක, කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත එම වෘත්තීය වැඩසටහන සඳහා නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රමිතීන් සමඟ එම වෘත්තීය වැඩසටහන අනුකූල වේ ද යන්න පිළිබඳව එම වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතික වේ නම් ඒවා ද සමග කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(4) වෘත්තීය, ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයක්, උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රතීතනය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා නිර්දේශ කරනු ලබන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ සඳහන් එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාවක් ඇතුළත එම ඌනතාව නිවැරදි කිරීම සඳහා ගත යුතු යම් පියවර එම නිර්දේශයන්හි ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ලැබුණු නිර්දේශ, වැරදි නිවැරදි කර ගැනීම සඳහා ගතයුතු ප්‍රතිකර්ම පියවර ගැනීම සඳහා සහ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් කාලසීමාවක් ඇතුළත කොමිෂන් සභාව වෙත නැවත වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තියේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනය වැරදි නිවැරදි කර ගැනීම සඳහා වැඩිදුර කාලසීමාවක් ඉල්ලා සිටින අවස්ථාවක දී, එකී ඉල්ලීම ලිඛිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර කොමිෂන් සභාව විසින් වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විමසා එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් වැඩිදුර කාලයක් ප්‍රදානය කළ හැකි ය.

(7) වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයකට උසස් අධ්‍යාපන ආයතනයකින් ඍජුවම ඉල්ලීමක් ලැබුණු අවස්ථාවක, මේ පනතේ කාර්ය සඳහා, එම වෘත්තිය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විසින් එම ඉල්ලීම ලද වහාම කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(8) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් නිර්දේශ කිරීම සඳහා වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයකට ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, ප්‍රතීතනය ප්‍රදානය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම එම මණ්ඩලයේ වගකීම විය යුතු ය.

(9) කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ ප්‍රතීතනය කිරීමේ කාර්යය සඳහා අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

**16.** (1) ආයතනයක හෝ වැඩසටහනක තාවකාලික ප්‍රතීතන සහතිකය, එය නිකුත් කරන ලද දිනයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා බලපැවැත්විය යුතු ය.

තාවකාලික ප්‍රතීතන සහතිකය.

(2) තාවකාලික ප්‍රතීතන සහතිකයෙහි කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද පරිදි එම ආයතනයට හෝ වැඩසටහනට ප්‍රදානය කරන ලද තාවකාලික ප්‍රතීතනයට අදාළ කරුණු අඩංගු කරනු ලැබිය යුතු ය.

(3) (අ) එම ආයතනයට හෝ වැඩසටහනට පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කළ යුතු වන්නේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට කලින් කලට කොමිෂන් සභාව වෙත එහි කටයුතු පිළිබඳ කලින් කලට වාර්තා ඉදිරිපත් කිරීමට; සහ

(ආ) මහජන තොරතුරු සඳහා එහි පරිශ්‍රයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක සහතිකය ප්‍රදර්ශනය කිරීමට,

තාවකාලික ප්‍රතීතන සහතිකය දරන්නාට නියම කරනු ලැබිය යුතු ය.

තාවකාලික ප්‍රතීතනයේ සිට පූර්ණ ප්‍රතීතනයට පරිවර්තනය කිරීම.

**17.** (1) තාවකාලික ප්‍රතීතන සහතිකයක් දරන්නා වූ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් අවස්ථාවෝචිත පරිදි ආයතනය හෝ එහි වැඩසටහන් පූර්ණ ප්‍රතීතනය කිරීම සඳහා නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියට සහ ආකාරයට සහ එවැනි කාලසීමාවක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයේ වාර්තාව ලැබීමෙන් පසුව-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කොන්දේසි මත එම ආයතනයට හෝ වැඩසටහනට හෝ ඒ දෙකටම පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කිරීම; හෝ

(ආ) තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩල වාර්තාවෙහි හඳුනාගන්නා ලද ගැටලු නිවැරදි කිරීම සඳහා තාවකාලික ප්‍රතීතන කාලසීමාව වසර දහයක උපරිම කාලසීමාවක් සඳහා දීර්ඝ කිරීම; හෝ

(ඇ) හේතු දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) එම ආයතනය වෘත්තීයමය වැඩසටහනක් සැපයීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ කාර්යය සඳහා නිර්දේශයන් ලබාදීම පිණිස කොමිෂන් සභාව විසින්, 15 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයට ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(4) උසස් අධ්‍යාපන ආයතනයකට හෝ වැඩසටහනකට පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කරන ලද අවස්ථාවක දී, එම ආයතනය හෝ වැඩසටහන විසින් සෑම අවුරුදු පහක් ඇතුළත ම ආයතනික විගණන සහ වැඩසටහන් සමාලෝචනය කරනු ලැබිය යුතු ය.

තවකාලික ප්‍රතීතනය අවලංගු කිරීම.

**18.** (1) තාවකාලික ප්‍රතීතන සහතිකයේ දින සිට වසර දහයක කාලසීමාවක් ඇතුළත පූර්ණ ප්‍රතීතනය ලබා ගැනීමට යම් උසස් අධ්‍යාපන ආයතනයක් අපොහොසත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාවට එම තාවකාලික ප්‍රතීතන සහතිකය අවලංගු කළ හැකි අතර-

(අ) උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් වන විට එහි කටයුතු නවතාලීමට; හෝ

(ආ) වැඩසටහනක් සම්බන්ධයෙන් වන විට එම වැඩසටහන පැවැත්වීම නතර කිරීම හෝ එම වැඩසටහන ප්‍රදානය කිරීම නවතාලීමට,

විධාන කළ හැකි ය.

(2) තාවකාලික ප්‍රතීතන සහතිකය අවලංගු කිරීමට පෙරාතුව කොමිෂන් සභාව විසින්,

(අ) තාවකාලික ප්‍රතීතන සහතිකය අවලංගු කිරීම සඳහා වන හේතු නිශ්චිතව දක්වමින් අවස්ථාවෝචිත පරිදි උසස් අධ්‍යාපන ආයතනයක අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන විධායක නිලධරයා, මූලික විධායක නිලධරයා හෝ මූලික පරිපාලන නිලධරයා වෙත කොමිෂන් සභාවේ අරමුණ ලිඛිතව දැනුම් දිය යුතු ය;

(ආ) එවැනි ලිඛිත දැනුම්දීමක දින සිට දින තිහක් ඇතුළත (3) වන උපවගන්තිය යටතේ පත්කරන ලද කමිටුවක් වෙත ලිඛිත නියෝජනයක් සිදුකිරීමට (අ) ඡේදයේ සඳහන් තැනැත්තන් වෙත අවස්ථාවක් ලබාදිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සිදුකරන නියෝජනයන් සලකා බැලීම සඳහා අමාත්‍යවරයා විසින් තත්ත්ව විගණනවරුන්ගේ මූල මණ්ඩලයේ සාමාජිකයන් නොවන සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ලිඛිත නියෝජනයන් සලකා බැලීමෙන් පසුව කමිටුව විසින්-

(අ) (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ප්‍රතීතන සහතිකය අවලංගු කිරීම; හෝ

(ආ) එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත පූර්ණ ප්‍රතීතනය ලබා ගැනීම සඳහා ගතයුතු ප්‍රතිකර්ම පියවර ගැනීමට එවැනි ආයතනයකට හෝ, තැනැත්තන්ට විධාන කිරීම,

සඳහා කොමිෂන් සභාව වෙත නිර්දේශ කළ යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්, කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

(6) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ පූර්ණ ප්‍රතීතනය ලබා ගැනීමට යම් උසස් අධ්‍යාපන ආයතනයක් අපොහොසත් වන අවස්ථාවක දී, එවැනි ආයතනයක තවකාලික ප්‍රතීතනය අවලංගු කිරීමට කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

(7) යම් උසස් අධ්‍යාපන ආයතනයක් (1) වන උපවගන්තිය යටතේ එහි කටයුතු නවත්වනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව අවශ්‍ය විය හැකි යැයි සලකනු ලබන පරිදි, ශිෂ්‍යයන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබාදීමට හෝ ශිෂ්‍යයන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහා බලයලත් අධිකාරියක් පත් කිරීම සඳහා පියවර ගැනීමට එම ආයතනයට විධාන කරනු ලැබිය යුතු ය.

(8) උසස් අධ්‍යාපන ආයතනයක් (1) වන උපවගන්තිය යටතේ එහි කටයුතු නවතන ලද අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම අවලංගු කිරීමේ දැන්වීම එහි වෙබ් අඩවියේ සහ ශ්‍රී ලංකාවේ බෙදා හරිනු ලබන අවම වශයෙන් එකක් බැගින් වන සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත්වල පළකරනු ලැබිය යුතු ය.

වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල හඳුනා ගැනීම.

**19.** මේ පනතේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, නියම කරනු ලබන ආකාරයට, යම් වෘත්තියක් හෝ රැකියාවක් නියාමනය කිරීමේ කාර්යය සඳහා පිහිටුවා ඇති වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයක් පිළිගත යුතු ය.

තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතන සහතිකයේ බලපෑම.

**20.** (1) කොමිෂන් සභාව විසින් තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතන සහතික ප්‍රදානය කරනු ලැබ ඇති ආයතනවල නාමයන් එහි වෙබ් අඩවියේ හෝ ශ්‍රී ලංකාවේ බෙදා හරිනු ලබන අවම වශයෙන් එකක් බැගින් වන සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත්වල පළ කරනු ලැබිය යුතු ය.

(2) තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතන සහතිකය, එම ආයතනය හෝ වැඩසටහන කොමිෂන් සභාව විසින් තාවකාලිකව හෝ පූර්ණව ප්‍රතීතිත ආයතනයක් හෝ වැඩසටහනක් බවට සාක්ෂියක් විය යුතු ය.

ප්‍රතීතිත උසස් අධ්‍යාපනික ආයතනයන්හි ලේඛනය.

**21.** (1) ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනයන්හි විස්තර ඇතුළත් කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් වන ලේඛනයක් ස්ථාපනයට සහ පවත්වාගෙන යාමට කොමිෂන් සභාව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති ලේඛනය, නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ගෙවීම මත යම් කාලසීමාවක් තුළ දී මහජන පරීක්ෂාව සඳහා තැබිය යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනයක ආදියක ව්‍යුහය වෙනස් කිරීම සඳහා පූර්ව අනුමැතිය.

22. ප්‍රතීතන උසස් අධ්‍යාපන ආයතනයක්-

(අ) වෙනත් ආයතනයක් සමග ඒකාබද්ධ වීමෙන් එහි ආයතනික ව්‍යුහය වෙනස් කිරීමට; හෝ

(ආ) එහි වැඩසටහන් වෙනස් කිරීමට; හෝ

(ඇ) ක්‍රියාකාරිත්වයේ වෙනත් යම් පැතිකඩක බලපෑමේ වෙනසක් සිදු කිරීමට,

අදහස් කරන අවස්ථාවක දී, එවැනි යෝජිත වෙනසකට පෙරාතුව ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය.

පූර්ණ ප්‍රතීතන සහතිකයක් අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

23. (1) උසස් අධ්‍යාපන ආයතනයක් -

(අ) ඇවර කරන හෝ එසේ නැතහොත් විසුරුවා හරින ලද අවස්ථාවක දී; හෝ

(ආ) පූර්ණ ප්‍රතීතන සහතිකයේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවක දී; හෝ

(ඇ) 49 (2) වගන්තිය යටතේ කරන ලද නියමයක් මත; හෝ

(ඈ) ප්‍රතීතනය ලබා ගැනීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත අසත්‍ය තොරතුරු සපයනු ලැබ ඇත්නම්; හෝ

(ඉ) පවත්වාගෙන යාම නවතා ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එහි පූර්ණ ප්‍රතීතන සහතිකය අත්හිටුවීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, එවැනි අත්හිටුවීමකට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමකට පෙරාතුව-

(අ) පූර්ණ ප්‍රතීතන සහතිකය අවලංගු කිරීම සඳහා වන හේතු නිශ්චිතව දක්වමින් උසස් අධ්‍යාපන ආයතනයක අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන විධායක නිලධරයා, මූලික විධායක නිලධරයා හෝ මූලික පරිපාලන නිලධරයා වෙත කොමිෂන් සභාවේ අරමුණ ලිඛිතව දැනුම් දිය යුතු ය;

(ආ) එවැනි ලිඛිත දැනුම්දීමක දින සිට දින තිහක් ඇතුළත (3) වන උපවගන්තිය යටතේ පත්කරන ලද කමිටුවක් වෙත ලිඛිත නියෝජනයක් සිදුකිරීමට (අ) ඡේදයේ සඳහන් තැනැත්තන් වෙත අවස්ථාවක් ලබාදිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද කාලය ඇතුළත උසස් අධ්‍යාපන ආයතනයක් නියෝජනයක් සිදු කරන අවස්ථාවක දී, එම ආයතනය විසින් ලබා දෙන ලද හේතු සලකා බැලීමෙන් සහ ඊට ඇහුම්කන් දීමෙන් පසු -

(අ) පූර්ණ ප්‍රතීතනය අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ දැන්වීම ආපසු කැඳවීම; හෝ

(ආ) පූර්ණ ප්‍රතීතනය අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම;

කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි ය.

(4) පූර්ණ ප්‍රතීතනය අත්හිටුවීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවස්ථාවක දී, අදාළ උසස් අධ්‍යාපන ආයතනයට එකී අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව වහාම දැනුම් දිය යුතු අතර, එකී අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම එකී දැන්වීමේ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(5) පූර්ණ ප්‍රතීතන සහතිකය, අත්හිටුවනු ලැබූ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එකී අත්හිටුවීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ දැන්වීම එහි වෙබ් අඩවියේ හෝ ශ්‍රී ලංකාව තුළ බෙදාහරිනු ලබන අවම වශයෙන් එකක් බැගින් වන සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත්වල පළ කළ යුතු ය.

(6) ප්‍රතීතන සහතිකය, අත්හිටුවනු ලැබූ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන පරිදි ශිෂ්‍යයන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබාදීමට හෝ ශිෂ්‍යයන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහා බලයලත් අධිකාරියක් පත් කිරීම සඳහා පියවර ගැනීමට එම ආයතනයට නියම කරනු ලැබිය යුතු ය.

ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනයක් බවට ව්‍යාජ ලෙස මවා පෙන්වීම මේ පනත යටතේ වරදක් වන බව.

**24.** (1) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව ප්‍රතීතනය ලබා ගැනීමෙන් තොරව යම් උසස් අධ්‍යාපන ආයතනයක් -

(අ) කොමිෂන් සභාව විසින් එම ආයතනය හෝ එහි වැඩසටහන් ප්‍රතීතනය කරන ලද බවට පොදු මහජනතාව නොමඟ යවන ආකාරයෙන් ප්‍රචාරණය කරයි නම්; හෝ

(ආ) එම ආයතනය ප්‍රතීතනය කරන ලද බවට මවා පාමින් එහි අධ්‍යයන පාඨමාලා හෝ වැඩසටහන් හෝ සුදුසුකම් ඉදිරිපත් කරනනේ නම් හෝ පවත්වන්නේ නම් හෝ අධ්‍යයන පාඨමාලා, වැඩසටහන් හෝ සුදුසුකම් සඳහා ශිෂ්‍යයන් බඳවා ගන්නේ නම්; හෝ

(ඇ) යම් උපාධි පිරිනැමීම හෝ යම් ඩිප්ලෝමා හෝ සහතික හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරන්නේ නම්; හෝ

(ඈ) අනිසි ආකාරයකින් කොමිෂන් සභාවේ ලාංඡනය භාවිත කරන්නේ නම්,

එවැනි උසස් අධ්‍යාපන ආයතනයක් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මේ පනත යටතේ ප්‍රතීතනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයක් හැර යම් ආයතනයක් කිසිදු තැනැත්තකු වෙත යම් උපාධි පිරිනැමීම, යම් ඩිප්ලෝමා, සහතික හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම නොකළ යුතු ය.

(3) යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් (1) වන හා (2) වන උපවගන්ති යටතේ වන වරදක් සිදුකරනු ලබන අවස්ථාවක දී, එම ආයතනයේ අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන විධායක නිලධරයා, මූලික විධායක නිලධරයා හෝ මූලික පරිපාලන නිලධරයා ඊට වරදකරුවකු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දඩය හා සිර දඬුවම යන දෙකටම යටත් කළ යුතු ය.

**තත්ත්ව විගණන මූල මණ්ඩල, ස්ථාවර කාරක සභා ආදිය පත් කිරීම.**

**25.** (1) කොමිෂන් සභාව විසින්, නියෝග මගින් නියම කරන ලද නිර්ණායකයන් මත පදනම්ව ආයතනික සහ වැඩසටහන් විගණන සහ බාහිර තත්ත්ව සහතික කිරීමේ සමාලෝචනයන් ක්‍රියාත්මක කිරීම පිණිස කොමිෂන් සභාවට සහයවීමේ කාර්යය සඳහා, තත්ත්ව සහතික කිරීමේ සුදුසුකම් ඇතුළුව විශේෂඥ සුදුසුකම් සහිත තැනැත්තන්ගෙන් සමන්විත තත්ත්ව විගණන මූල මණ්ඩල සහ ස්ථාවර කාරක සභා යම් ප්‍රමාණයක් පත් කළ යුතු ය.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා සෑම ස්ථාවර කාරක සභාවක ම පූර්ණ කාලීන සාමාජිකයෙකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද යම් තත්ත්ව විගණන මූල මණ්ඩලයක සාමාජිකයන්ට යම් දීමනාවක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි අතර එවැනි දීමනා කොමිෂන් සභාව විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි ය.

**කොමිෂන් සභාව විසින් ප්‍රවීනයන් සහ කමිටු පත් කිරීම.**

**26.** (1) කොමිෂන් සභාව විසින් කලින් කලට, ඊට උචිත යැයි සලකනු ලබන පරිදි එවැනි යම් ප්‍රවීනයකු හෝ කමිටුවක් මගින් එහි කටයුතු ඉතා කඩිනමින් ක්‍රියාත්මක කළ හැකි හෝ කළමනාකරණය කළ හැකි බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන යම් කාර්යයක් සඳහා ප්‍රවීනයන් හෝ කමිටු යම් ප්‍රමාණයක් පත් කළ හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද එවැනි එක් එක් තැනැත්තෙකුගේ හෝ කමිටුවක අදාළ නියමයන් පැහැදිලිව හා නිශ්චිතව දැක්විය යුතු අතර හෝ අවශ්‍ය වූ විට එසේ පත් කරන ලද යම් තැනැත්තෙක් සේවයෙන් ඉවත් කිරීම හෝ කමිටුවක් විසුරුවා හැරීම සිදුකළ හැකි ය.

(3) මේ පනතේ විධිවිධානයන්ට යටත්ව, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද එක් එක් කමිටුවක් එහි රැස්වීම්වලට සහ එවැනි රැස්වීම්වල දී සිදුකරන ලද කාර්යයන්වලට අදාළව ක්‍රියාපටිපාටිය නියාමනය කළ හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද යම් කමිටුවක් සාමාජිකයන්ට යම් දීමනාවක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි අතර එවැනි දීමනා කොමිෂන් සභාව විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ අංශයන් පිහිටුවීම.

**27.** (1) කොමිෂන් සභාව විසින් පහත සඳහන් ක්‍රියාකාරී අංශයන් ඇතුළුව අංශයන් යම් ප්‍රමාණයක් පිහිටුවනු ලැබිය යුතු යඃ-

(අ) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමු අංශය; සහ

(ආ) ශ්‍රී ලංකා තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන අංශය.

(2) සෑම අංශයක් ම කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන තැනැත්තන් යම් ප්‍රමාණයකින් සමන්විත විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් කලින් කලට ලිඛිත ඉල්ලීමක් මඟින්, එම ඉල්ලීමෙහි සඳහන් කාලසීමාව තුළ එහි නිශ්චිතව සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් එහි තාක්ෂණික උපදේශනයන් ලබා දෙන ලෙස (1) වන උපවගන්තියේ සඳහන් අංශවලින් ඉල්ලා සිටිය හැකි අතර, එම කරුණ සම්බන්ධයෙන් ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ එහි තාක්ෂණික උපදේශය ලබාදීම එම අංශයේ කාර්යය විය යුතු ය.

ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමු අංශයේ කර්තව්‍ය

**28.** ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමු අංශයේ කර්තව්‍යයන් පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

(අ) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව යාවත්කාලීන කිරීම සහ එය ක්‍රියාවෙහි යෙදවීමට අදාළව කොමිෂන් සභාවට අවශ්‍යවන නිර්දේශයන් සිදුකිරීම;

(ආ) පිළිගැනීම සඳහා විදේශීය උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතාවන් සහ අදාළ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවෙහි ප්‍රමිතිය තක්සේරු කිරීම සහ කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඇ) (i) උසස් අධ්‍යාපන ආයතන මඟින් ප්‍රදානය කරනු ලබන සම්මානයන් හි සහ අවශ්‍ය සුදුසුකම් හි ප්‍රමිතියට සහ නාමාවලීන්ට; සහ

(ii) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවට (SLQF) අනුව වන සුදුසුකම් හඳුනාගැනීමේ ලක්ෂණ සහ ප්‍රමිතිය හඳුනාගැනීමේ ලක්ෂණයන්ට,

අදාළව රීතීන් සකස් කිරීමට කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඇ) උසස් අධ්‍යාපනික අංශයේ සහ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන අංශයේ සහ නිර්දේශිත වෘත්තීය මාර්ගයන්හි සචලතාවට පහසුකම් සැලැස්වීමට සහ ප්‍රගමනයට කොමිෂන් සභාව වෙත නිර්දේශ සිදුකිරීම;

(ඉ) විවිධ උසස් අධ්‍යාපන ආයතනයන් මගින් සපයනු ලබන සුදුසුකම් සැසඳීම මත පදනම් වූ නිර්දේශ කොමිෂන් සභාව වෙත සිදුකිරීම;

(ඊ) යම් උසස් අධ්‍යාපන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන වැඩසටහන් සහ අධ්‍යයන පාඨමාලාවන්, විභාග, උපාංග සහ වෙනත් පහසුකම් සහ එම ආයතන මගින් සේවයේ යොදවනු ලබන ගුරුවරුන්ට සහ වෙනත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අදාළ ප්‍රමිතීන්, ඇතුළත්ව එවැනි ආයතන විසින් පවත්වාගෙන යා යුතු වන අවම අධ්‍යාපනික ප්‍රමිතීන්, අවශ්‍ය අවස්ථාවල දී අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විමසා තීරණය කිරීම;

(උ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වනු ලබන වැඩසටහන් සහ අධ්‍යයන පාඨමාලාවන් හි ලබා දෙනු ලබන පුහුණුවේ ස්වභාවය තීරණය කිරීම;

(ඌ) උසස් අධ්‍යාපන ආයතන මගින් ප්‍රදානය කරනු ලබන සම්මානයන්හි උදෘත පිටපතේ ආකෘතිය සහ භාෂාව තීරණය කිරීම; සහ

(එ) එම අංශයේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන අංශය සමඟ අදාළ සෑම තොරතුරක් ම හුවමාරු කර ගැනීම.

තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන අංශයේ කර්තව්‍ය.

**29.** තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන අංශයේ කර්තව්‍යයන් පහත පරිදි වන්නේ යః-

(අ) අවශ්‍ය අවස්ථාවල දී, අදාළ වෘත්තිය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල විමසා උපාධි, ඩිප්ලෝමා සහ

වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා උසස් අධ්‍යාපන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන වැඩසටහන්වලට සහ අධ්‍යාපනික පාඨමාලාවන් වලට, සපයනු ලබන අධ්‍යාපනයේ තත්ත්වයන්ට සහ පවත්වනු ලබන විභාගයන්ට අදාළ ප්‍රමිතීන් ඇතුළත්ව, උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වාගෙන යා යුතු වන අවම අධ්‍යයන ප්‍රමිතීන්ට අදාළවන රීතීන් සැකසීමේ දී කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ආ) යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් සැපයීමට නියමිත කාර්ය මණ්ඩලයේ තත්ත්වය, උපාංග, ඉගැන්වීමේ මූලාශ්‍ර සහ වෙනත් පහසුකම්වලට අදාළව නිර්ණායක සහ ප්‍රමිතීන් තක්සේරු කිරීම සහ කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම;

(ඇ) සෑම උසස් අධ්‍යාපන ආයතනයක ම තත්ත්වය සහ මට්ටම, බාහිර සම වයස් කණ්ඩායම්වල සමාලෝචන ක්‍රියාවලියක් මගින් කලින් කලට ඇගයීම සහ ඒ පිළිබඳ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම;

(ඈ) ප්‍රතීතන කාර්යය සඳහා අවශ්‍යවන ප්‍රමිතීන් කරා ළඟා නොවූ උසස් අධ්‍යාපන ආයතන විසින් ළඟා කර ගැනීම අවශ්‍ය වන්නා වූ නිර්ණායක සහ ප්‍රමිතීන් පිළිබඳ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඉ) යෝග්‍යතා මාර්ගෝපදේශ රාමු අංශය සමඟ අදාළ සෑම තොරතුරක් ම හුවමාරු කර ගැනීම.

තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලය පත් කිරීම.

**30.** (1) කොමිෂන් සභාවේ පූර්ව අනුමතිය ඇතිව තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන අංශයේ ප්‍රධානියා විසින් -

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකන යම් පුහුණුවකින් පසු ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවෙහි (SLQF) විගණන ඇතුළත්ව බාහිර තත්ත්ව විගණනවල කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා නියම කරන ලද සුදුසුකම් ඇති තැනැත්තන් තත්ත්ව විගණන මූල මණ්ඩලයෙන් විගණකවරුන් වශයෙන් පත්කරනු ලැබිය යුතු ය; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද තත්ත්ව විගණකවරුන්ට පවරන ලද යම් විශේෂ පැවරුමක ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍යවන ක්‍රියා පටිපාටීන් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) වැඩසටහන්වලට අදාළව බාහිර තත්ත්ව විගණන කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා එකී විගණන ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලද තත්ත්ව විගණකවරුන්ගෙන් තුනෙන් එකක ප්‍රමාණයක් අදාළ වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය විසින් නම් කරනු ලැබිය යුතු ය.

(3) විගණකවරයෙකු ලෙස පත්කරන ලද සෑම තැනැත්තෙකුට ම තත්ත්ව සහතික කිරීමේ අංශයේ ප්‍රධානියා විසින් පත්වීමේ ලිපියක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ තත්ත්ව විගණකවරයෙකු වශයෙන් පත්කරනු ලැබූ තැනැත්තෙකුට කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව තත්ත්ව සහතික කිරීමේ අංශය විසින් තීරණය කළ හැකි පරිදි අනුපාතිකව, ඔහු හෝ ඇය විසින් ක්‍රියාවට නංවන ලද යම් පැවරුමකට අදාළව පාරිශ්‍රමික හෝ දීමනා කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළු වීමට කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තත්ත්ව විගණකවරුන්ට ඇති බලය.

31. (1) කොමිෂන් සභාව විසින් ලිඛිතව බලය පවරන ලද තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලය, සති දෙකකට නොඅඩු ලිඛිත දැන්වීමක් ලබාදීමෙන් පසුව, උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළු විය යුතු අතර විගණනයක් සිදුකර පහත දැක්වෙන කරුණු දැන ගැනීමේ කාර්ය සඳහා යම් පරීක්ෂණයක්, විමර්ශනයක්, හෝ විමසීමක් සිදු කරනු ලැබිය යුතු ය:-

(අ) යම් අදාළ සුදුසුකමක් ප්‍රදානය කිරීම හෝ ලබාදීම සිදුකරන උසස් අධ්‍යාපන ආයතනයෙන් සපයන ලද වැඩසටහන් සහ අධ්‍යයන පාඨමාලා නියම කරන ලද අවම ප්‍රමිතීන්ට අනුකූල වේ ද යන්න;

(ආ) එවැනි ඕනෑම සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ ලබා දීමේ කාර්යය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වන ලද විභාගවල දී පනවන ලද ප්‍රවීණතා මට්ටම නියමිත ප්‍රමිතීන්ට අනුව පවතී ද යන්න;

(ඈ) එහි වැඩසටහන් සඳහා උසස් අධ්‍යාපන ආයතනය විසින් සපයන ලද ආයතනය, කාර්ය මණ්ඩලය, උපාංග, යටිතල පහසුකම් සහ වෙනත් පහසුකම් නියම කරන ලද අවම ප්‍රමිතීන්ට අනුකූලවේ ද යන්න; සහ

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයේ පාලනය, කළමනාකරණය සහ මූල්‍ය පැවැත්ම, එවැනි ආයතනයක් මෙහෙයවීම සඳහා යෝග්‍ය වේ ද යන්න.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, උසස් අධ්‍යාපන ආයතනයක් විසින් තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලය එම ආයතනයට පැමිණීමට පෙර ස්වයං තක්සේරු වාර්තාවක්, අදාළ තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලය විසින්, එම උපවගන්තිය යටතේ කරනු ලබන එවැනි යම් පරීක්ෂණයක්, විමර්ශනයක් හෝ විමසීමක් පවත්වන අවස්ථාවක දී, එහි සොයාගැනීම් සහ යම් නිර්දේශ ඇත්නම් ඒවා ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාවට ලබාදිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තත්ත්ව විගණකවරුන්ගේ සෑම මූල මණ්ඩලයක් විසින් ම, එම උපවගන්තිය මගින් එවැනි තත්ත්ව විගණකවරුන්ගේ මූල මණ්ඩලයක් වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) (1) වන හා (2) වන උපවගන්ති මගින් යම් තත්ත්ව විගණකවරයෙකු වෙත පවරා ඇති යම් බලතලයක් ක්‍රියාත්මක කිරීමේ දී මූල මණ්ඩලයේ තත්ත්ව විගණකවරයෙකුට කිසිදු තැනැත්තකු බාධා කිරීම හෝ විරෝධය දැක්වීම නොකළ යුතු ය.

## III වන කොටස

### කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**32.** (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකන යම් නිලධරයන් සහ සේවා නියුක්තිකයන් — කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

සංඛ්‍යාවක් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(2) උසස් තත්ත්වයේ කළමනාකරණ සහ සේවා පළපුරුද්දක් සහිත තත්ත්ව සහතික කිරීම සහ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) යන ක්ෂේත්‍රයන් පිළිබඳ පළපුරුද්ද ඇති තැනැත්තෙකු කොමිෂන් ෂභාවේ ලේකම්වරයා වශයෙන් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ලේකම්වරයා, පූර්ණ කාලීන නිලධරයෙකු විය යුතු අතර කොමිෂන් සභාවේ වාර්තා සහ දේපළ භාරයේ තබාගැනීමේ වගකීම දැරිය යුතු ය. ඔහු කොමිෂන් සභාවේ සහකාර ගිණුම් නිලධරයා ද විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පූර්ණ කාලීන නිලධරයෙකු විය යුතු මුල්‍ය පාලකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(5) මුල්‍ය පාලකවරයා, ලේකම්වරයාගේ පාලනයට සහ විධානයට යටත්ව කොමිෂන් සභාවේ මුල්‍ය පරිපාලනයට වගකිවයුතු සේම, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් හා ආකාරයකින් එහි ගිණුම් පවත්වා ගත යුතු අතර, කොමිෂන් සභාවේ අරමුදල් සිය භාරයේ තබාගත යුතු ය.

කොමිෂන් සභාවට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

33. (1) රජයේ සේවයේ නියුක්ත කවර හෝ නිලධරයෙකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාවේ ඉල්ලීම මත, නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයෙකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයෙකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් කොමිෂන් සභාවට සේවය කිරීමට ගිවිසුමක් යටතේ එකඟ වී ඇති යම් තැනැත්තෙකු, කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා කොමිෂන් සභාවට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික.

**34.** කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව යම් පාරිශ්‍රමික සහ දීමනා කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව.

**35.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව-

(අ) ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ යම් සාමාජිකයෙකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල හෝ ලේඛනවල නාම ලේඛනයක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය.

**36.** අවශ්‍යවන තාක් දුරට, ආයතන සංග්‍රහයේ සහ විනය කරුණු සම්බන්ධයෙන් රජය විසින් නිකුත් කරන ලද යම් චක්‍රලේඛවල විධිවිධාන සහ මෙම පනත යටතේ සාදන ලද නියෝග, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

37. (1) ලිඛිතව නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි යම් කොන්දේසිවලට යටත්ව මේ පනත යටතේ එහි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය සභාපතිවරයාට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුට හෝ නිලධරයෙකුට කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි අතර, සභාපතිවරයා හෝ එකී වෙනත් සාමාජිකයා හෝ නිලධරයා විසින් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විශේෂ හෝ සාමාන්‍ය විධිවිධානවලට යටත්ව එකී බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය. බලය පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද එවැනි යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## මූල්‍යමය විධිවිධාන

38. (1) කොමිෂන් සභාවට එයටම වෙන් වූ අරමුදලක් තිබිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදල.

(2) (අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කවර හෝ ප්‍රභවයකින් කොමිෂන් සභාව වෙත ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) (i) උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය;

(ii) උසස් අධ්‍යාපන ආයතනවලට, ප්‍රතීතන සහතික නිකුත් කිරීම සහ අලුත් කිරීම; සහ

(iii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සපයනු ලබන වෙනත් යම් සේවාවක්,

සඳහා ගාස්තු ලෙස අයකරනු ලබන කොමිෂන් සභාව වෙත ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරන ලද සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ආ) මේ පනතේ මේ කොටස මගින් හෝ ඒ යටතේ හෝ අරමුදලින් ගෙවීමට බලය පවරන ලද හෝ නියමිත වෙනත් යම් වියදමක්,

කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**39.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියලු මූල්‍ය ගණුදෙනු කටයුතු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු අතර, ඒවා කොමිෂන් සභාවේ කාර්යාලයේ තැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, කෙමිෂන් සභාවේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් සෑම වසරක ම එහි ගිණුම් විගණකාධිපතිවරයා ලවා විගණනය කරවනු ලැබිය යුතු ය. එම ගිණුම් සම්බන්යෙන් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයාට සහාය වීමේ කාර්යය සඳහා ඔහුගේ විධානයන් සහ මෙහෙයවීම

යටතේ ක්‍රියා කළ යුතු සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමට විගණකාධිපතිවරයාට හැකි ය.

(6) කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් දරනු ලැබූ වියදම් පියවීමේ කාර්යය සඳහා, ඔහුට, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් පාරිශ්‍රමිකයක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයා වෙත කොමිෂන් සභාව විසින් ගෙවනු ලබන යම් පාරිශ්‍රමික, එම විගණන කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් යොදවනු ලැබූ යම් සුදුසුකම්ලත් විගණකවරයකුට ගෙවනු ලබන ප්‍රමාණයන් අඩු කිරීමෙන් පසුව, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා, "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කාර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

(8) විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර-

(අ) ඔහුට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට හැකි වූයේ ද නැද්ද යන්න සඳහන් කරමින්;

(ආ) වාර්තාවේ සඳහන් කරන ලද ගිණුම් එම කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් පෙන්නුම් කරන පරිදි නිසි පරිදි සාදා තිබේ ද, නැද් ද යන්න සඳහන් කරමින්; සහ

(ඇ) ඔහුගේ මතය අනුව, එම කොමිෂන් සභාවේ ක්‍රියාවන් සහ ගිණුම් පිළිබඳ පරීක්ෂණයක දී පාර්ලිමේන්තුවට වැදගත් විය හැකි, ගිණුම්වල ඇති ඕනෑම අයිතමයක් සඳහා අවධානය යොමු කරමින්,

වාර්තාවක් ලබා දිය යුතු ය.

(9) විගණකාධිපතිවරයා විසින් ඔහුගේ වාර්තාව කොමිෂන් සභාව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(10) (9) වන උපවගන්තියේ සඳහන් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව, කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු අතර, එවැනි වාර්තාවක පෙන්වා දෙනු ලබන කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති හෝ ගැනීමට යෝජිත පියවර සම්බන්ධයෙන් එම වාර්තාව කොමිෂන් සභාව වෙත භාර දෙනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත කොමිෂන් සභාව විසින් විගණකාධිපතිවරයා දැනුවත් කරනු ලැබිය යුතු ය.

(11) වාර්තාව අදාළ වන ගිණුම් ප්‍රකාශනය, එකී ගිණුම් හා වාර්තා අදාළවන වර්ෂයට පසු එළඹෙන වර්ෂයේ අවසානයට පෙර, එහි පිටපත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු සැලැස්විය යුතු අමාත්‍යවරයා වෙත භාරදිය යුතු අතර කොමිෂන් සභාවේ සභාපතිවරයා පාර්ලිමේන්තුවේ පොදු ගිණුම් කාරක සභාව ඉදිරියේ පෙනී සිට එහි දී පැන නගින ප්‍රශ්න වලට පිළිතුරු දිය යුතු ය.

**කොමිෂන් සභාවේ වාර්ෂික අය වැය**

**40.** අයවැය අදාළවන මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට නොවැඩි කාලයකට පෙර කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු අයවැයක් එක් එක් මුදල් වර්ෂයට අදාළව කොමිෂන් සභාව විසින් පිළියෙළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

**තාවකාලික පාවිච්චියට ගැනීමට ඇති බලය**

**41.** කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි යම් මුදලක් අයිරාවක් මඟින් හෝ අන්‍යාකාරයකින්

මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය මත අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් තාවකාලිකව පාවිච්චියට ගනු ලැබිය හැකි යː

එසේ වුව ද, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ණය මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන්ගේ එකතුව, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

කොමිෂන් සභාවේ මුදල් ආයෝජනය.

**42.** කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් එහි මුදල් ආයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් දරන ලද වගකීම් තෘප්ත කිරීමේ කාර්යය සඳහා ඇපයක් වශයෙන් කොමිෂන් සභාව සතුව පවතින යම් නිශ්චල දේපළක් භාවිත කිරීම, එම කාර්යය සඳහා මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයන්ට අනුකූලව සිදු කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් නඩුවලින් හෝ නඩු පැවරීමෙන් ආරක්ෂා කිරීම.

**43.** (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයෙකු හෝ ඒ සාමාජිකයා හෝ නිලධරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ කොමිෂන් සභාවට නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ කර්තව්‍යයක් හෝ බලයක් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී සද්භාවයෙන් කරන ලද කවර වූ ක්‍රියාවක් හේතුකොටගෙන ඒ සාමාජිකයා හෝ නිලධරයා කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද වියදම් කොමිෂන් සභාවේ අරමුදලින් පියවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවනු ලැබූ හෝ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලැබූ ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් පරිදි එවැනි යම් තැනැත්තකු විසින් කරන ලද වියදමක් මේ පනත යටතේ ඔහු විසින් කරන ලද

යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ සාමාජිකයා හෝ නිලධරයා විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ඒ වියදම් අයකර ගතහොත් හැර කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.

**44.** (1) (අ) කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ ප්‍රතීතනය කරන ලද ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත රාජ්‍ය, පෞද්ගලික, දේශීය සහ විදේශීය, උසස් අධ්‍යාපන ආයතනවල ලැයිස්තුවක් සැපයීම, එම එක් එක් ආයතනයට සහ වැඩසටහනට ප්‍රවේශය ලබා ගැනීම සඳහා වන විවිධ ආකාරයන් හි සුදුසුකම් සහ අවශ්‍යතා ඇතුලුව ප්‍රතීතන තත්ත්ව සහතික කිරීමට අදාළ වන තොරතුරු සැපයීමේ; සහ

(ආ) උසස් අධ්‍යාපන ආයතන සහ වැඩසටහන්වලට ප්‍රවේශවීමට අදාළව ඇතිවන ගැටලු සම්බන්ධයෙන් ශිෂ්‍යයන් හට උපදෙස් ලබා දීමේ,

කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) උසස් අධ්‍යාපනයට අදාළ වන සුදුසුකම් හඳුනා ගැනීමට පහසුකම් සැලසීම සඳහා අදාළ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු සැපයීම කොමිෂන් සභාව විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන ලේඛනය මහජනයාට තොරතුරු සඳහා ලබා ගත හැකි වන ලෙස තැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සංකේතය, සැලැස්ම හෝ නිරූපණය.

**45.** (1) කොමිෂන් සභාව විසින් තෝරාගනු ලැබිය හැකි හෝ සැලසුම් කරනු ලැබිය හැකි යම් සංකේතයක්, සැලැස්මක් හෝ නිරූපණයක් භාවිතා කිරීමට හා ඉන් මතු එම තෝරාගන්නා ලද හෝ සැලසුම් කරන ලද සංකේතය, සැලැස්ම හෝ නිරූපණය ප්‍රදර්ශනය කිරීමට හෝ දක්වාලීමට කොමිෂන් සභාව වෙත අනන්‍ය අයිතියක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ තෝරාගෙන ඇති හෝ සැලසුම් කර ඇති සංකේතයක්, සැලැස්මක් හෝ නිරූපණයක් හෝ කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇති හෝ සැලසුම් කර ඇති යම් සංකේතයක්, සැලැස්මක් හෝ නිරූපණයක් සමඟ සර්ව සම වන යම් සංකේතයක්, සැලැස්මක් හෝ නිරූපණයක් හෝ ඊට සමාන වන, මුලා කරවන හෝ ව්‍යාකූලතාවක් ඇති කරන හෝ මුලා කරවීමට හෝ ව්‍යාකූලතාවක් ඇති කිරීමට ඉඩ තිබෙන යම් සංකේතයක්, සැලැස්මක් හෝ නිරූපණයක් කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව භාවිත කරනු ලබන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයින් රාජ්‍ය සේවකයින් වශයෙන් සැලකිය යුතු බව.

**46.** කොමිෂන් සභාවේ සියලු සාමාජිකයින්, නිලධරයන් සහ සේවා නියුක්තිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයින් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**47.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව, කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

අමාත්‍ය මණ්ඩලයේ විධාන.

**48.** මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එහි බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද අදාළ විධානයන් අමාත්‍යවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අතර එවැනි සියලු විධානයන් ක්‍රියාවේ යෙදවීම කොමිෂන් සභාවේ වගකීම විය යුතු ය.

සාමාන්‍ය දණ්ඩනය.

**49.** (1) මේ පනතේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් හෝ නියෝගයක් හෝ මේ පනතේ යම් විධිවිධානයක් යටතේ පනවන ලද යම් නියමයක් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක්, විධානයක්, නියමයක් හෝ නිශ්චය කිරීමක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු දඩ මුදලකට හෝ වසර දෙකකට නොඅඩු බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් තැනැත්තකු යම් වරදකට වරදකරු කරනු ලැබීමක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම වරදට නියම කර ඇති යම් දණ්ඩනයක් පැනවීමට අමතරව හෝ ඒ වෙනුවෙන්, නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන දිනට පෙරාතුව II වන කොටස යටතේ ප්‍රදානය කරන ලද තත්ත්වය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට විධාන කරමින් යම් නියෝගයක් ලබා දීමට හැකි වන්නේ ය.

(3) (1) වන උපවගන්තියෙහි විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ ලිඛිත අවසරය ඇතිව හැර මේ පනත යටතේ යම් වරදකට කිසිදු නඩු පැවරීමක් සිදු නොකළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන වැරදි.

**50.** මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රීතියක් හෝ නියෝගයක් යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන විධායක නිලධරයා, මූලික විධායක නිලධරයා, හෝ ප්‍රධාන පරිපාලන නිලධාරියා ඇතුළුව එහි සියලුම අධ්‍යක්ෂවරු හා නිලධරයන්; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරදට වරදකරු විය යුතු යඃ

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයා හෝ මූලික විධායක නිලධාරියා හෝ ප්‍රධාන පරිපාලන නිලධරයා හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ වරද කරන ලද්දේ තමාගේ දැනුමින් තොරව බව හෝ වරද කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්යෝගයෙන් යුතුව තමා ක්‍රියාකළ බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කළහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

රීති.

**51.** කොමිෂන් සභාව විසින්-

(අ) තත්ත්ව විගණන මූල මණ්ඩලය වෙත විවිධ නිලධරයින් පත්කිරීම, සේවා නියුක්තිය සහ නිලයෙන් පහකිරීම සහ ඔවුන්ගේ බලතල, කර්තව්‍ය, මෙහෙයවීම හා පාරිශ්‍රමික ගෙවීම;

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම්, වාර්ෂික මහ සභා රැස්වීම සහ අතිවිශේෂ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියා පටිපාටිය;

(ඇ) කොමිෂන් සභාවේ කටයුතු කළමනාකරණය;

(ඈ) යම් ප්‍රතීතිත උසස් අධ්‍යාපන ආයතනයක් විසින් රාජ්‍ය ලාංඡනය සහ කොමිෂන් සභාවේ සංකේතය භාවිතය;

(ඉ) මේ පනත යටතේ රීති සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති ඕනෑම කරුණක්,

සම්බන්ධයෙන් රීති සකස් කරනු ලැබිය හැකි ය.

නියෝග.

**52.** (1) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව මේ පනත මගින් නියම කළ යුතු යැයි නියමිත යම් කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් නියෝග සාදනු ලැබීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබ ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, විශේෂයෙන් ම පහත කාරණා සියල්ලම හෝ යම් කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි යː-

(අ) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF) තීරණය කිරීම;

(ආ) උසස් අධ්‍යාපන ආයතනවලට හෝ වැඩසටහන්වලට තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතනය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා වෘත්තීය, ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල මගින් නිකුත් කර ඇති අධ්‍යාපනයෙහි අවම ප්‍රමිතීන් ඇතුළුව තත්වය සහ ප්‍රමිතීන් සහ උසස් අධ්‍යාපන ආයතනවල හෝ වැඩසටහන්වල අධ්‍යාපනයෙහි අධ්‍යයන ප්‍රමිතීන් තක්සේරු කිරීම සහ ඇගයීම;

(ඇ) විදේශ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා, එවැනි උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා හඳුනාගැනීමේ කාර්යය සඳහා ඇගයීම;

(ඈ) තාවකාලික හෝ පූර්ණ ප්‍රතීතනයට ඉල්ලුම් කිරීමේ හෝ ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, ආකෘති පත්‍ර, ආකාරය, නිර්ණායක, කාලසීමා සහ වෙනත් මාර්ගෝපදේශ;

(ඉ) මේ පනත යටතේ නියම කිරීමට නියමිත ප්‍රතීතනය සඳහා වන අයදුම්පත්‍ර, සහතික සහ වෙනත් ලේඛන;

(ඊ) මේ පනත යටතේ යම් සේවාවන් සඳහා වන ගාස්තු සහ අය කිරීම්;

(උ) මූලික නිෂ්කාශනය ප්‍රදානය සඳහා වන ආකෘති පත්‍ර, ආකාරය සහ නිර්ණායක; සහ

(ඌ) වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩල හඳුනාගැනීමේ ආකාරය සහ ක්‍රමය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම, *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු අතර, එය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එම අනනුමතිය ලද දින සිට

බලපැවැත්වෙන පරිදි, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි ප්‍රත්‍යාදිෂ්ට වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එවැනි ම නියෝගයක් මගින් ඕනෑම අවස්ථාවක දී, සංශෝධනය කිරීම, එකතු කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සිදුකළ හැකි ය.

රහස්‍යතා ප්‍රකාශය.

**53.** මේ පනතේ අධිකාරය යටතේ පත්කරන ලද සෑම තැනැත්තෙක් ම, තම කාර්යය භාර ගැනීමට පෙර මේ පනත යටතේ සිය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඔහුට දැන ගැනීමට ලැබුණු යම් තොරතුරක්,

(අ) නීතියෙන් එසේ කිරීම අවශ්‍ය වූ විට; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයකට අනුකූලවීම පිණිස හෝ වන විට හැර,

සම්පූර්ණ රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශය මගින් එවැනි කිසිදු තොරතුරක් හෙළි නොකරන බවට සහතික විය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම.

**54.** (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද රීති, නියෝග හෝ නියම බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවක් පැන නැඟුනහොත්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් මේ පනත බලාත්මකවීම ආරම්භ වන දින සිට වසරක කාලසීමාවක් සඳහා එම දුෂ්කරතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බවට අමාත්‍යවරයාට පෙනෙන මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධාන සමඟ අනනුකූල නොවන එවැනි විධිවිධාන සැලැස්වීම කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම එය සෑදීමෙන් පසු ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

## VI වන කොටස

### අන්තර්කාලීන විධිවිධාන

යෝග්‍යතා මාර්ගෝපදේශ අංශයක් සහ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවනු ලබන තෙක් වූ විශේෂ විධිවිධාන.

**55.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද,–

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 137 වන වගන්තිය යටතේ සාදනු ලැබ 2013 අගෝස්තු මස 22 දිනැති අංක 1824/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රීති, මේ පනතේ ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් ක්‍රියාත්මකව පැවතිය යුතු ය;

(ආ) මේ පනත බලාත්මක වන දිනයට පෙර දිනට ඉක්බිතිව ම වන දිනයෙහි උසස් අධ්‍යාපන විෂයය පරවන ලද අමාත්‍යාංශයෙහි අමාත්‍යවරයා විසින් පළකරන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (SLQF), මේ පනත යටතේ එය සංශෝධනය කරන්නේ නම් මිස, මේ පනත සමග එය අනනුකූල නොවනතාක් දුරට, තවදුරටත් බලාත්මක කරනු ලැබිය යුතු ය;

(ඇ) (i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලබන උසස් අධ්‍යාපන ආයතනවල 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය යටතේ හඳුනාගනු ලැබූ ආයතනවල තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සම්බන්ධයෙන්, මේ පනතේ 2 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව පිහිටුවීමේ දින සිට මාස හයක කාල සීමාවක් සඳහා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වගකිව යුතු ය;

(ii) (ඇ) (i) ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සම්බන්ධයෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන උසස් අධ්‍යාපන ආයතනවල සහ 1978 අංක

16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය යටතේ හඳුනාගනු ලැබූ ආයතනවල තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනය සම්බන්ධ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම කළ යුතු ය;

(ඇ) (i) මේ පනතේ 2 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව පිහිටුවනු ලබන දිනයේ සිට මාස හයක කාලසීමාවක් සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඇ (1) හා (2) වගන්ති සමඟ කියවිය යුතු 25අ වගන්තියේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් යම් ආයතනයක් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයක් වශයෙන් හඳුනාගත හැකි ය;

(ii) (ඇ) (i) ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඇ(1) සහ (2) වගන්ති සමඟ කියවිය යුතු 25අ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එවැනි උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනවල තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනයට අදාළ කටයුතු කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ය;

(ඉ) (i) මේ පනතේ 2 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව පිහිටුවනු ලැබූ දින සිට මාස හයක කාලසීමාවක් සඳහා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඇ වගන්තිය සමඟ කියවිය යුතු 70ආ වගන්තිය යටතේ පත්කරනු ලැබූ බලයලත් අධිකාරිය, උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනවල තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතනය සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ii) (ඉ) (i) ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70(ඇ) වගන්තිය සමඟ කියවිය යුතු 70ආ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එවැනි උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනවල තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනයට අදාළ කටයුතු කොමිෂන් සභාව ක්‍රියාත්මක කළ යුතු ය;

(ඊ) (ඇ) (i) ඡේදය යටතේ කරගෙන යනු ලැබූ ක්‍රියාවන් හැර බලයලත් අධිකාරිය විසින් කරගෙන යනු ලැබූ සහ මේ

පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වන දිනයෙහි පැවති අවසන් නොකළ යම් ක්‍රියාකාරකමක්, මේ පනතේ විධිවිධාන සමඟ එය අනනුකූල නොවන්නේ නම් මිස, කොමිෂන් සභාව විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය;

(උ) මේ පනත බලාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පවතින බලයලත් අධිකාරියේ සියලු වගකීම් කොමිෂන් සභාවේ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ)(i), (ඈ)(i) සහ (ඉ)(i) ඡේදයන්ගේ කාර්යය සඳහා, කොමිෂන් සභාවේ කටයුතුවල ප්‍රාරම්භක හෝ යටිතල පහසුකම් සැලැස්වීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින්, එම නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි වැඩිදුර කාලසීමාවක් සඳහා, මාස හයක කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එකී දීර්ඝ කිරීම එක් වසරකට වඩා නොඉක්මවිය යුතු ය.

**56.** මේ පනතේ - අර්ථ නිරූපණය.

"අමාත්‍යවරයා" යන්නෙන්, උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ප්‍රතීතනය" යන්නෙන්, සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි හෝ වෙනත් යම් සුදුසුකමක් ප්‍රදානය කිරීමට යොමු වූ උසස් අධ්‍යාපන ආයතනයකට හෝ එම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ශාස්ත්‍රීය වැඩසටහනක් සඳහා, එම ආයතනය හෝ වැඩසටහන නියමිත අපේක්ෂිත ප්‍රමිති සහ තත්ත්ව ළඟාකර ඇති බවට සහතික කරමින් නිල පිළිගැනීම ප්‍රදානය කිරීමේ ක්‍රියාව අදහස් වේ;

"උසස් අධ්‍යාපනය" යන්නෙන්, යම් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, වෙනත් යම් උසස් සුදුසුකමක් හෝ ඊට සමාන තත්ත්වයන් ප්‍රදානය කිරීමට නියම කරන සාම්ප්‍රදායික, විවෘත හෝ දුරස්ථ අධ්‍යයන ක්‍රම හෝ ඒවා මිශ්‍ර වූ

අධ්‍යයන ක්‍රමයන්ගෙන් යුතු ද්විතික ඉහළ පෙළ මට්ටමට වඩා වූ යම් ශාස්ත්‍රීය අධ්‍යයන පාඨමාලවක් හෝ වෙනත් අධ්‍යයනයන් අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 147 වගන්තියේ උසස් අධ්‍යාපන ආයතනය යටතේ අර්ථ දැක්වූ යම් ස්ථිතියක්; 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ උසස් අධ්‍යාපනය සඳහා පිහිටුවන ලද ආයතන හෝ මධ්‍යස්ථාන; 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24ආ යටතේ උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන හෝ මධ්‍යස්ථාන වශයෙන් හඳුනාගන්නා ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වගන්තිය යටතේ හඳුනාගන්නා ලද ආයතන, ආයතන හෝ විද්‍යාල 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ උසස් අධ්‍යාපනය සැලසීමේ නිරතවීමට පිහිටුවන ලද ආයතන, උසස් අධ්‍යාපනය සැලසීම සඳහා, යම් පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවන ලද ආයතන සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි හෝ වෙනත් යම් සුදුසුකම් පිරිනමන යම් උසස් අධ්‍යාපන ආයතන හෝ විදේශීය විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ වී ඇති වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ උසස් අධ්‍යාපනය සැපයීම සඳහා පිහිටුවා ඇති වෙනත් යම් දේශීය හෝ විදේශීය ආයතන අදහස් වේ;

"ජනාධිපති" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"මූලික නිෂ්කාශන සහතිකය" යන්නෙන්, යම් උසස් අධ්‍යාපන ආයතනයක භෞතික යටිතල පහසුකම් සැකසීමට සහ මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර එහි කටයුතු ආරම්භ කිරීම සඳහා කොමිෂන් සභාව විසින් එකී උසස් අධ්‍යාපන ආයතනයට පිරිනමනු ලබන සහතිකය අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින් නියම කරන ලද යන්න අදහස් වේ;

"වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය" යන්නෙන්, යම් වෘත්තියකට සම්බන්ධ තත්ත්ව සහතික

කිරීමේ සහ ප්‍රතීතනයට අදාළ ප්‍රමිති නිශ්චය කිරීමේ කාර්යය සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද විශේෂඥ වෘත්තීය මණ්ඩලයක් අදහස් වේ;

"වැඩසටහන" යන්නෙන්, වෘත්තීය වැඩසටහන් සහ අධ්‍යයන පාඨමාලා ඇතුළත්ව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවෙහි 3 වන මට්ටම සහ ඉහළ සුදුසුකම් ප්‍රදානයට තුඩු දෙන දේශීය හෝ විදේශීය අසමසම අනුමත විෂය මාලාවක් අදහස් වේ;

"වෘත්තීය වැඩසටහන" යන්නට, විශේෂිත වෘත්තියක් හෝ වෘත්තීය සුදුසුකමක් සඳහා ශිෂ්‍යයන් සූදානම් කිරීමට සකස් කරන ලද අධ්‍යාපන වැඩසටහනක් ඇතුළත් වේ;

"අදාළ වෘත්තීමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලය" යන්නෙන්, මේ පනතේ 19 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ දේශීය හෝ විදේශීය වෘත්තීමය හෝ ව්‍යවස්ථාපිත හෝ නියාමන මණ්ඩලයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව" යන්නෙන්, මේ පනත මගින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් සපයන ලද ජාතික සැලැස්ම අදහස් වේ;

"ව්‍යවස්ථාපිත අධිකාරිය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ආ වගන්තිය යටතේ පත්කරන ලද යම් අධිකාරියක් අදහස් වේ;

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**57.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.